# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office } 2484500 2484600 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax } (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website } www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No. }
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2013.09. 11

**රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක:** 02/2013

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
රාජ්‍ය ව්‍යාපාර හා ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
රාජ්‍ය ව්‍යාපාර හා ව්‍යවස්ථාපිත ආයතන වල භාණ්ඩාගාර නියෝජිතයින් හා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත,

**සේවක අර්ථසාධක අරමුදල් පනත, සේවක භාරකාර අරමුදල් පනත, සේවක පාරිතෝෂික ගෙවීම් පනත හා ආදායම් බදු පනත් අනුව ගෙවිය යුතු දායක මුදල් ගෙවීම විධිමත් කිරීම**

ඇතැම් රාජ්‍ය ව්‍යාපාර හා ව්‍යවස්ථාපිත ආයතන විසින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු වාරික මුදල් සේවකයින්ගේ වැටුපෙන් අඩු කළ ද ව්‍යවස්ථාපිත නියමයන්ට අනුකූලව සේව්‍ය හා සේවක දායක මුදල් අදාල කාල සීමාව තුල අදාල අරමුදල් වලට ප්‍රේෂණය නොකරන බවත් ඒ තුලින් විශාල ලෙස හිඟ වාරික එකතුවී ඇති බවත් වරින් වර වාර්තා වී ඇත. එසේම පාරිතෝෂික ගෙවීම් පනත අනුව ගෙවිය යුතු පාරිතෝෂික මුදල් නියමිත පරිදි සේවකයින්ට නොගෙවන බවත් ආදායම් බදු පනත් වල විධිවිධාන අනුව සේවකයන්ගෙන් කපාගත් බදු මුදල් යනාදිය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත නියමිත පරිදි ප්‍රේෂණය නොකරන බවත් වාර්තා වී ඇත.

2. මෙමගින් සේවක අර්ථසාධක අරමුදල් පනත, සේවක භාරකාර අරමුදල් පනත, පාරිතෝෂික ගෙවීම් පනත සහ අදාල බදු පනත් යනාදිය උල්ලංඝනය කිරීමක් සිදු වන අතර, වාරික ප්‍රමාද වීම මත ගෙවිය යුතු දඩ මුදල් හා නීති කටයුතු වෙනුවෙන් ආයතනයට අමතර පිරිවැයක් දැරීමට ද සිදු වේ. එසේම මෙමගින් සේවකයන්ට හිමි අර්ථසාධක සහ වෙනත් ව්‍යවස්ථාපිත ගෙවීම් පිළිබඳ අවිනිශ්චිත තත්ත්වයක්ද උද්ගත කර ඇත.

3. මෙම තත්ත්වයට පිළියම් වශයෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට සියලුම ප්‍රධාන ගණන්දීමේ නිළධාරීන්/ ගණන්දීමේ නිළධාරීන්/ සභාපතිවරුන්/ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සහ වෙනත් අදාල නිළධාරීන් මෙයින් දැනුවත් කෙරේ.

3.1 රජයේ අයවැය ප්‍රතිපාදන මගින් වැටුප් ගෙවනු ලබන ආයතන අනෙකුත් වියදම් දැරීමට පෙර හා වැටුප් ගෙවීමට සමගාමීව සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා වන වාරික අනිවාර්යයෙන් ගෙවිය යුතු ය.

3.2 සියලුම ආයතන විසින් මේ වන විට ගෙවීමට ඇති යම් හිඟ මුදලක් ඇත්තේනම් එය සම්පූර්ණව හා නිවැරදිව ගණනය කර ප්‍රායෝගික කාලරාමුවක් තුල එක්වර හෝ වාරික කිහිපයකින් ගෙවීමට හැකිවන පරිදි දින වකවානු සහිත උපලේඛනයක් සකස් කර එය වහාම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කළ යුතු ය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උපලේඛනයේ පිටපත් අමාත්‍යාංශ ලේකම්ට හා අදාල වන පරිදි මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

3.3 එසේම උපයන විට ගෙවීමේ බද්ද, අදාල බදු උපදෙස් පරිදි එම බද්දට යටත්වන නිළධාරීන්ගේ වැටුපෙන් අඩුකර වැටුප් ගෙවීමට සමගාමීව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට නිසි පරිදි ප්‍රේෂණය කළ යුතු ය.

3.4 තවද සෑම අධ්‍යකෂ මණ්ඩල රැස්වීමකදීම අධ්‍යකෂ මණ්ඩල සාමාජිකයින් වෙත කරන ගෙවීම් වලින් අදාල පරිදි උපයන විට ගෙවීමේ බද්ද අඩුකරගෙන එම ගෙවීමට සමගාමීව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේශණය කළ යුතු ය.

3.5 පාරිතෝෂික ගෙවීම් පනත අනුව වාර්ෂිකව ගනණය කරන ලද පාරිතෝෂික අරමුදල සඳහා වන වෙන් කිරීම් ද නිසි පරිදි අදාල ගිණුමෙහි තැම්පත් කළයුතු අතර යම් සේවාදායෙකයෙකු පාරිතෝෂික අරමුදල් ලබා ගැනීමට සුදුසුකම් ලද පසුව හැකි ඉක්මනින් අදාල මුදල් ඔහු වෙත ලබා දීමට කටයුතු කළ යුතු ය.

3.6 එම අඩුකිරීම් හා ගෙවීම් නිසි පරිදි සිදු වන්නේදැයි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදීත් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදීත් සමාලෝචනය කළ යුතු ය. එසේම ප්‍රධාන ගණන්දීමේ නිළධාරීන්/ගණන් දීමේ නිළධාරීන් විසින් තමා යටතේ වන සියලුම රාජ්‍ය ව්‍යාපාර හා ආයතන වල ව්‍යවස්ථාපිත ගෙවීම් යනාදිය පනත් වලට අනුකූලව නියමිත කාලසීමාව තුල ගෙවන බවට අමාත්‍යාංශ මට්ටමේ කළමනාකරණ විගණන රැස්වීම්වල දී සමාලෝචනය කර තහවුරු කරගත යුතු ය.

3.7 මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් අනුව කටයුතු කිරීමේ අවශ්‍යතාවය අදාල ආයතන වල අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත විසින් එම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පෙන්වා දිය යුතු ය. යම් ගැටළුකාරී තත්ත්වයක් වෙතොත් පළමුව ඒ සම්බන්ධව අදාල වන පරිදි රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් උපදෙස් ලබාගත යුතු ය. තව දුරටත් නිරවුල් නොවන තත්ත්වයන් පිළිබඳව අදාල අමාත්‍යාංශ ලේකම්වරයාට දැනුම් දී එහි පිටපතක් මට ද ඉදිරිපත් කළ යුතු ය. එම තත්ත්වයන් පිළිබඳව සොයා බලා මා සමඟ සාකච්ඡාකර විසඳුමකට එළඹීම අදාල අමාත්‍යාංශ ලේකම් වරුන්ගේ වගකීම වේ.

3.8 අභ්‍යන්තර විගණන අංශයන් මේ තත්ත්වය නිරන්තරයෙන් විගණනයට ලක් කළයුතු අතර, ඒ පිළිබඳව ආයතන ප්‍රධානීන්ගේ අවධානයට යොමු කළ යුතු ය.

3.9 එසේම, ඉහත 3.1 සිට 3.5 දක්වා සඳහන් කර ඇති අඩුකිරීම් හා ගෙවීම් නිසි පරිදි හා කලට වෙලාවට සිදු කරන බවටත්, වැටුප් ගෙවීමට සමාන ප්‍රමුඛතාවයකින් යුතුව ඒ හා සමගාමීව අදාල ප්‍රේෂණයන් සිදුකරන බවටත්, තවදුරටත් හිඟ දායක මුදල් වර්ධනය නොවන බවටත් අදාල ආයතනවල සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන විධායක නිළධාරීන් හා විෂයභාර නිලධාරීන් සාමූහිකව හා තනි තනිව වගකීමට බැඳී සිටී.

3.10 මෙම චක්‍රලේඛයේ විධිවිධාන නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ ද යන්න අධීක්ෂණය කිරීමේ වගකීම අදාල අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත පැවරේ.

පී.බී. ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත්:
1. ජනාධිපති ලේකම්,
2. අමාත්‍යමණ්ඩල ලේකම්,
3. විගණකාධිපති
4. කම්කරු කොමසාරිස්
5. දේශීය ආදායම් කොමසාරිස්